

# කතෘගෙන්

මීමැස්සන් විසින් ආහාර හා භෝග බීජයන්ගේ පරාගනය සිදු කරනවාත් හැර, මී පැණි පිරිසිදු ස්වාභාවික ආහාරයක් බැවින් මීමැසි පාලනය පිළිබඳව දූන් දූන් උද්‍යොගය වැඩි වේගෙන එයි.

මී පැණි කලින් ජීරණයවී ඇති ආහාරයක් බැවින් එය මනුෂ්‍ය ශරීරය විසින් වහා අවශෝෂණය කර ගනී. වැඩෙන දරුවන්ට එය පහසුවෙන් ශක්තිය ලබා දෙන ආහාර වර්ගයකි. මනුෂ්‍ය ලෙඩරෝග සාදන බැක්ටීරියා වර්ග, මීපැණිවල වර්ධනය නොවනවාත් හැර ශීතනය නොකොට, බොහෝ කල් තැන්පත් කර තබා ගත හැකි වූ, ආහාර ස්වල්පයෙන් එකක් මීපැණි වේ.

මීමැස්සෝ උන්ගේ ආහාර සොයා මල්වලට පිවිසෙන බැවින් පරපරාගණය සිදුවී, වැඩියෙන් ඵල සවිවීම ඇති වන බැවින් මීමැස්සන් ඇති නොකරන ඉඩම් වලට වඩා මීමැස්සන් ඇති කරණ ඉඩම්වලින් පළතුරු රනිල බෝග, කපු, පොල් වැනි වඩා දියුණු වූ භෝග අස්වැන්නක් ලැබේ.

මීමැස්සන් ඇති කරන්නාගේ ආයුධ කොටසක් මානසික හා කොටසක් කායික බලවේගයෝ ය.

මෙම ලාභය හා විනෝදය ගෙන දෙන ව්‍යාපාරයේ දියුණුව, කාර්‍යසූර වැඩ සඳහා අවශ්‍ය වූ මීමැස්සන් ඇතුළු නිසි ආයුධ හා මීවද සහිත අතිරේකයන් වලටත් වඩා, මීමැසි ජනපදයේ හැසිරීම හා ජීවිත ප්‍රවෘත්තිය පිළිබඳ දැනීම මත ස්ථිර වෙයි.

පළමුවෙන්ම වදය තැන්පත් කිරීම සඳහා හොඳ විනිවිඡයක් අත්‍යවශ්‍ය ය. වැඩිමනත් මී පැණි නිස්සාරණය කිරීම සඳහා තැන්පත් කිරීමටත්, වැඩෙන ජනපදයට අවශ්‍ය මීමැසි ආහාර නිෂ්පාදනය සඳහා මල්පැණි හා පරාග එකතු කිරීම සඳහාත් විශාල මල් සංඛ්‍යාවක් මීමැස්සන්ට අත්‍යාවශ්‍යය. මීමැස්සන්ගේ පියාඹීමේ අන්තරය යාර 700ක් පමණ බැවින් මල් හිහ කලට අතිරේක කෑම සැපයීම සඳහා ගෝචර බීම් පිළිබඳව නිසි දැනීමක් ඇතිවීමෙන් මීමැස්සන් ඇති කිරීමට බලාපොරොත්තු වන්නාට නියම ප්‍රතිඵල ලබා ගැනීමට පුළුවන.

වද පරීක්ෂා කළ යුත්තේ කුමණ කාරණයක් නිසාද, කුමණ කාලවලටද යනු දැනගත යුතුවේ. සාමාන්‍යයෙන් අවශ්‍යතරම් ආහාර තිබේ නම් මීමැස්සෝ, ශක්ති සම්පන්න, ක්‍රියා ශීලී ස්වාධීන ජනපදයකට පරිවර්තනය වේ. පලිබෝධක යින් සිටීදැයි දැන ගැනීමටද, පැටවුන් බෝවීම හරියාකාර සිදුවීම හා පැණි පිරුණු වද ගැලවීම සඳහාද වරින් වර මීමැසි පෙට්ටිය ඇර බැලිය යුතු ය.

මේවා කිරීමට මීමැස්සන්ගේ හැසිරීම පිළිබඳව මූලික දැනීමක් අවශ්‍යය. මීමැස්සන් පාලනය කර තබා ගැනීම සඳහා ස්මෝකරය හා වද ගැලවීම පිළිබඳව පළපුරුද්දක් හා දැනීමක් අවශ්‍යය. නැතහොත් මීමැසි ඇති කරන්නාට තමන්ගේ කාර්‍යය ඉටු කළ හැකි නොවේ.

මෙතැන් සිට පළවන සඟරාවල මීමැසි පාලනය පිළිබඳ ලිපි පෙළක් පළ කිරීමට අදහස් කෙරේ. එයින් ආධුනිකයාට මීමැසි පාලනය පිළිබඳ අවබෝධ යක් ලබා දෙන්නට බලාපොරොත්තු වෙමු. ඒ සමගම කෘෂිකර්ම ව්‍යාප්ති සේවයෙන් දෙන උපදෙස් හා පහසුකම් සමගින් අනාගතයේදී අතිරේක ආහාරයක් වශයෙන් වැඩියෙන් මීපැණි නිෂ්පාදනය වීමට උපකාරයක් වේවායි අපි බලා පොරොත්තු වෙමු.